මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදිකිරීම්,
කර්මාන්ත සහ ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශය - වයඹ පළාත
வீதி அபிவிருத்தி, போக்குவரத்து, கூட்டுறவு அபிவிருத்தி, மற்றும் வர்த்தகம், வீடமைப்பு மற்றும் நிர்மாணம்,
தொழில் மற்றும் கிராம அபிவிருத்தி நடவடிக்கைப் பற்றிய அமைச்சு - வடமேல் மாகாணம்
Ministry of Road, Transport, Co-operative Development and Trade, Housing and Construction, Industrial and
Rural Development - North Western Province

පළාත් සභා කාර්යාල සංකීර්ණය - කුරුණෑගල. | மாகாண சபை பணிமனைத் தொகுதி - குருணாகல். | Provincial Council Office Complex, Kurunegala.

මගේ අංකය / எனது இலக்கம் / My No. NWP/PHD/DF/2
ඔබේ අංකය / உமது இலக்கம் / Your No.
දිනය / திகதி / Date 2017.04.26

වයඹ පළාත තුළ ස්ථාපිත සියලුම පළාත් සභා රාජ්‍ය ආයතන ප්‍රධානින්,
ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානින් සහ
මධ්‍යම රජය යටතේ වන ආයතන ප්‍රධානින් වෙත,

"තිරසර පුරවර" නිවාස ව්‍යාපෘතිය - අදියර 1

මෙම අමාත්‍යාංශයට අයත් විෂය පථය යටතේ ස්ථාපිත 2012 අංක:04 දරණ "වයඹ නිවාස සහ ඉදිකිරීම්" පිළිබඳ ප්‍රඥප්තියට අනුකූලව ක්‍රියාත්මක "වයඹ නිවාස සහ ඉදිකිරීම් සංවර්ධන අරමුදල" මගින් ඉහත නිවාස යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරනු ලැබේ. ඒ යටතේ ප්‍රතිලාභ සලසා ගැනීමේ මහඟු අවස්ථාව වයඹ පළාත තුළ ස්ථාපිත සියලුම පළාත් සභා රාජ්‍ය ආයතන/ව්‍යවස්ථාපිත ආයතන මෙන්ම මධ්‍යම රජය යටතේ වන ආයතන වලද සේවකයින්ට සැලසී ඇති බව සතුටින් දැනුම් දෙමි.

02. ආරම්භක පියවරක් ලෙස මෙම ව්‍යාපෘතිය මගින් ඉතාමත් සහනදායී මිළ ගණන් යටතේ නිවාස බිම් කොටස් සැපයීමට අරමුණු කර ඇත. දැනට ක්‍රියාත්මක ව්‍යාපෘතිය යටතේ ප්‍රතිලාභ සලසා ගැනීමට ඔබ ආයතනයේ සේවය කරන අයවලුන් උනන්දුවක් දක්වන්නේ නම් වයඹ පළාත් සභා පරිශ්‍රයේ "ඒ" ගොඩනැගිල්ලේ, පතුල් මහලේ ස්ථාපිත පළාත් නිවාස සහ ඉදිකිරීම් දෙපාර්තමේන්තුවේ මුදල් සහකාර වෙත රු:100.00 ක ගාස්තුවක් ගෙවා ලබාගත් ලදුපතක් ඉදිරිපත් කර හෝ ඕනෑම තැපැල් කාර්යාලයකින් සභාපති/ලේකම් වයඹ නිවාස සහ ඉදිකිරීම් සංවර්ධන අරමුදල නමින් ලබාගත් රු:100.00 ක් වටිනා මුදල් ඇණවුමක් යොමු කිරීම මගින් අදාල අයදුම්පත ලබාගත හැක.(සැ.යු. මෙම මුදල ආපසු ගෙවනු නොලැබේ)

03. මේ සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන අයවලුන් ඔබ ආයතනයේ සිටී නම් ඔවුන් දැනුවත් කරන ලෙසත්, මෙය ඔබගේ කාර්යාලයේ දැන්වීම් පුවරුවේ පලකරන ලෙසත් කාරුණිකව ඉල්ලා සිටිමි.

04. යෝජිත ව්‍යාපෘතිය පිහිටි ඉඩම පිළිබඳ විස්තර සහ ඉල්ලුම්පත් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ලබන අයවලුන් සහ ඉල්ලුම්පත් ඉදිරිපත් කලයුතු ආකාරය පිළිබඳ තොරතුරු ඇමුණුම්හි දක්වා ඇත. ඉල්ලුම්පත් බාරගනු ලබන්නේ 2017.05.22 දින ප.ව. 02.00 දක්වා පමණි. එදින අදාල වේලාවට පසුව ඉදිරිපත් කරන අයදුම්පත් පිළිබඳව සලකා බලනු නොලැබේ.

මේ පිළිබඳව වැඩිදුර තොරතුරු දැනගැනීමට අවශ්‍ය වන්නේ නම් දුරකථන අංක: 071 4431960 ඔස්සේ නිවාස සහ ඉදිකිරීම් දෙපාර්තමේන්තුවේ තොරතුරු නිලධාරී ලෙස නම්කර සිටින සංවර්ධන නිලධාරී (නිවාස) ප්‍රමෝද් දේශප්‍රිය මහතා ඇමතීමෙන් ලබාගත හැක.

ඒ.ඩී. අමරසිරි,
අමාත්‍යාංශ ලේකම්/අරමුදලේ සභාපති,
මාර්ග,ප්‍රවාහන, සමුපකාර සංවර්ධන සහ වෙළඳ,නිවාස හා ඉදිකිරීම්,
කර්මාන්ත සහ ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශය(වයඹ)


| | ගරු අමාත්‍ය / கௌரவ அமைச்சர் / Hon. Minister | ලේකම් / செயலாளர் / Secretary | කාර්යාල / காரியாலயம் / Office | පාලන / நிருவாக / Admin: | ගිණුම් / கணக்கு / Accounts: | සැලසුම් / திட்டமிடல் / Planning: |
|---|---|---|---|---|---|---|
| දුරකථන / தொலைபேசி / Telephone | 037 2233132 | 037 2233131 | 037 2221456 | 037 2233808<br>037 2233831 | 037 2221676 | 037 2233803 |
| ෆැක්ස් / பெக்ஸ் / Fax | 037 2233132 | 037 2233131 | | | 037 2221676 | 037 2233803 |

ඇමුණුම 01

<u>යෝජිත ව්‍යාපෘතිය පිහිටි ඉඩමට ප්‍රවේශ මාර්ගය සහ දළ සැලැස්ම</u>




බිම් කට්ටි සැලැස්ම



01. <u>ඉල්ලුම්පත් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ලබන අයවළුන්</u>

(අ) වයඹ පළාත් සභාව යටතේ වන රාජ්‍ය හෝ ව්‍යවස්ථාපිත ආයතනයක සේවය ස්ථිර කරන ලද නිලධාරියෙකු /නිලධාරිණියක වීම හෝ මධ්‍යම රජය යටතේ වන ආයතනයක සේවය ස්ථිර කරන ලද නිලධාරියෙකු/නිලධාරිණියක වීම.

(ආ) වයඹ පළාත් සභා සංකීර්ණයේ සිට කි.මී. 06 ක අර්ධ විශ්කම්භයකින් යුත් දුර සීමාවට ඇතුලත් වන ප්‍රදේශයෙහි ඉල්ලුම්කරුට හෝ සිය කලත්‍රයාට අයත් ඉඩමක් නොමැතිවීම.

(ඇ) විවාහක අයෙකුවීම (දරුවන් සිටින වැන්දඹු,දික්කසාද අයවළුන්ද සලකා බලනු ලැබේ)

(ඈ) ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 11 වගන්තියේ සඳහන් කාරණයක් සඳහා දේපල ණය ලබාගත් අයෙකු නොවීම.

03 <u>ප්‍රතිලාභීන් තෝරා ගන්නා ආකාරය</u>

(අ) ඉදිරිපත් කරනු ලබන ඉල්ලුම්පත් තේරීම් මණ්ඩලයකට ඉදිරිපත් කරනු ලැබේ.

(ආ) සැපයීමට යෝජිත නිවාස බිම් කොටස් ප්‍රමාණයට සමාන සංඛ්‍යාවක් තේරීම් මණ්ඩලය විසින් සපයනු ලබන ලැයිස්තුවට අනුව ලකුණු ලබා ගෙන ඇති අයවළුන් අතරින් අනු පිළිවෙලට වෙන්කර ගෙන තුසපත් ඇදීම මඟින් බිම් කොටස් වෙන්කර දීම සිදුකෙරේ.

(ඇ) තෝරා ගැනීම පිළිබඳ අවසාන තීරණය අරමුදලේ පාලක මණ්ඩලය සතුවේ.

04. <u>බිම් කොටසක මිල</u>

අවම :- රු:960,000.00 උපරිම :- රු:1,300,000.00